**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2016**

---

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 ජුනි 01 සිට 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියේ 17(2) වගන්තිය හා 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 විද්‍යායතනය පිහිටුවීම

2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 5 (ඉ) වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ 2016 ජුනි 01 දින සිට බලාත්මක වන පරිදි වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් සකස් කරන ලද 2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලිය යටතේ එහි අනුබද්ධ ආයතනයක් ලෙස බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටුවා තිබුණි. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5, 6, හා 7 මට්ටමේ සහ ඒ සමාන මට්ටම්වල තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව වත්කම් භාවිතයට සුදානම් තත්ත්වයට පත්වූ දින සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත්, පාඨමාලාවලට අදාළව භාවිතා කළ හැකි ලෙස සකසා නොතිබුණු එකතුව රු. 84,529,310 ක් වූ පුහුණු උපකරණ වෙනුවෙන් ගිණුම් කාලපරිච්ඡේදයට අදාළව රු. 1,696,441 ක් ක්ෂය කර තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මගින් ඉදිරිපත්කල උපලේඛනයට අනුව විද්‍යායතනය වෙත 2015 වර්ෂය තුල රු. 98,693,921 ක ස්ථාවර වත්කම් ලබාදී තිබුණ ද විද්‍යායතනය ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව එය රු. 94,090,956 ක් වූයෙන් රු. 4,602,965 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 හා 757 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් හා ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යායතනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ රු. 3,904,303 ක් වටිනා පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, විද්‍යායතනයේ 2016 ජුනි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 2,775,099 ක අතිරික්තයක් විය. සමාලෝචිත වර්ෂයේ සේවක පිරිවැය රු. 5,270,505 ක් වුවද රජයේ ප්‍රදාන රු. 13,151,154 ක් ලැබීම අතිරික්තය සඳහා ප්‍රධාන හේතුව වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජුනි 29 දිනැති ගැසට් නිවේදනය පරිදි 2016 ජුනි 01 දින සිට බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය බලාත්මක වියයුතු වුව ද, අධ්‍යයන කටයුතු ආරම්භ කර තිබුණේ සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 14 දින දීය.

(ආ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව, ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු ආයතන ලියාපදිංචි වීම හා ප්‍රතීතනය කල යුතු වුවද, විද්‍යායතනය ආරම්භ කල පාඨමාලා 06 සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 29 දිනැති අංක 4/2010 දරන පරිසර අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 10 ඡේදය පරිදි රජයේ ඉඩම් වල ඉවත් කරන දැව රාජ්‍ය දැව සංස්ථාවට භාර දිය යුතු වුවත්, විද්‍යායතනය විසින් විද්‍යායතනය ඉදිකිරීමේදී ඉවත්කරන ලද දැව, පෞද්ගලික ආයතනයක් වෙත රු. 41,918 ක මුදලකට විකුණා තිබුණි.

(ආ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් 2016 අගෝස්තු 18 හා ඔක්තෝබර් 03 දිනයන්හිදී විද්‍යායතනය වෙත ලබා දී තිබූ වාහන 02 ක් විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඉන් එක් වාහනයක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) කෑගල්ල මිනින්දෝරු කාර්යාලය හරහා ජාතික තරුණ සේවා සභාව වෙතින් විද්‍යායතනය පවත්වාගෙන යාම සඳහා ලබාගන්නා ලද අක්කර 05 ක ඉඩමේ අයිතිය 2016 දෙසැම්බර් 31 දින වන විටත් විද්‍යායතනයේ නමට පවරා ගෙන නොතිබුණි.

**4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

-------------------------------------------

රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව විද්‍යායතනය විසින් ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා ලබාගැනීම සඳහා පෞද්ගලික ආයතන දෙකක් තෝරාගෙන තිබුණු අතර, පාලක මණ්ඩල අනුමැතියකින් තොරව මෙම සේවාවන්හි සේවා කාලය දීර්ඝ කරමින් සමාලෝචිත කාලපරිච්ඡේදය තුල සේවා ලබාගැනීම වෙනුවෙන් රු. 2,307,641 ක් වැයකර තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

සැලසුම් කළ පාඨමාලා නියමිත පරිදි ආරම්භ නොකිරීම හේතුවෙන් බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය වෙත 2015 වර්ෂය තුල නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය විසින් ලබා දී තිබූ රු. 84,529,310 ක් වටිනා පුහුණු උපකරණ නිශ්කාර්යව පවතින බව 2017 මැයි 31 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය පිහිටුවීමට පෙර අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා 2015 වර්ෂයේ ජනවාරි 01 දින හා ජූලි 02 දිනයන්හිදී පිළිවෙලින් නිලධාරීන් 4 දෙනෙකු හා 14 දෙනෙකු විද්‍යායතනය වෙත බඳවාගෙන එදින සිට අමාත්‍යාංශයට අයත් වෙනත් ආයතනවල සේවය සඳහා අනුයුක්ත කර තිබුණි. ඒ අනුව විවිධ ශ්‍රේණීන්ට අයත් මෙම කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 18 දෙනා මාස 17 කට වැඩි කාලයක් සේවයේ යොදවාගෙන වැටුප් හා දීමනා සහ අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් රු. 10,282,015 ක වියදමක් ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘති අරමුදලින් වැයකර තිබුණි.

(ආ) 2014 ජනවාරි 22 දිනැති අංක DMS/1670 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් විද්‍යායතනය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලයට අයත් නොවූ සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර පුස්තකාලයාධිපති යන තනතුරු සඳහා නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගෙන ඇති නිලධාරී විද්‍යායතනයේ වැඩ බලන සහකාර ලේඛකාධිකාරී තනතුරට පත් කර තිබීම හේතුවෙන් සහකාර පුස්තකාලයාධිපති තනතුරෙහි රාජකාරි නිසි පරිදි ඉටු වී නොතිබුණි.

(ඇ) ඉහත (ආ) හි සඳහන් ලිපිය පරිදි විද්‍යායතනය සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද, ප්‍රධාන විධායක නිලධාරී හා කථිකාචාර්ය යන තනතුරු දෙක සඳහා පමණක් බඳවාගැනීමේ පරිපාටියක් අනුමත කරවා ගෙන තිබුණි. කෙසේ වුවද, විද්‍යායතනය අනිකුත් කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේදී වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අනුමත බඳවාගැනීමේ පරිපාටිය අනුගමනය කර තිබුණි. එහෙත් කිසිදු බඳවාගැනීමේ පරිපාටියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී උපදේශක තනතුරු 02 ක් සඳහා බඳවාගැනීම් සිදුකර තිබුණි.

(ඇ) ආධුනික කථිකාචාර්යවරුන් ලෙස බඳවා ගෙන තිබුණු විදේශ උපාධි හිමි නිලධාරීන් දෙදෙනෙකුගේ උපාධි සහතික නිකුත් කළ ආයතන වෙතින් සනාථ කර ගැනීමට විද්‍යායතනය කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

-----------------------

2016 ඔක්තෝබර් සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කළ බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත පැවරී තිබුණි. කෙසේවුවද සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාලව විද්‍යායතනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

---------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව විද්‍යායතනයේ ඉදිරි දැක්ම පිළිබිඹු වන අයුරින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විද්‍යායතනයේ අධ්‍යක්ෂකගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය, පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම | මුදල් පොත යාවත්කාලීනව පවත්වාගෙන නොයාම, සුළු මුදල් හා අත්තිකාරම් සඳහා ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | වත්කම් ගිණුම් තැබීම හා ලේඛන පවත්වා නොගැනීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විධිමත්ව සිදු නොකිරීම හා පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු නොකිරීම. |